**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 0I, - 2016**

---

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ - අදියර 0I, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල් - පී110 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති ලියවිල්ලේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩිකිරීම සහ එමඟින් ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයන් හා සෞඛ්‍ය තත්ත්වයන් වර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,515 කට සමාන ජපන් යෙන් මිලියන 6,817 ක් වූ අතර රු.මිලියන 8,726 කට සමාන ජපන් යෙන් මිලියන 5,166 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර 2018 පෙබරවාරි වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

### 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**2.1** **මතය**
**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**
**-----------------------------------------**

**2.2.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 ජූනි 14 දිනදීය.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.මිලියන 6.61 ක් වූ එකතු කළ අගය මත බදු කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට ශ්‍රී ලංකා රජයේ දායකයට එරෙහිව හිලව් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ සහ ශ්‍රී ලංකා රජයේ දායකය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 437.27 ක් වටිනා කෙරීගෙන යන වැඩ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 431.92 ක් වූ අනුරූපී කෙරීගෙන යන වැඩ වටිනාකම සමඟ එකඟ වී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දක්වා | |
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 5,166 | 8,726 | 75.00 | 76.04 | 98.91 | 369.46 | 446.44 |
| ශ්‍රී ලං ර | 1,651 | 2,789 | 63.45 | 29.14 | 39.05 | 135.78 | 164.49 |
| එකතුව | 6,817 | 11,515 | 138.45 | 105.18 | 137.96 | 505.24 | 610.93 |

මාස 60 ක් වූ ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් මාස 46 ක් ඉකුත් වීමෙන් පසුවත් රු.මිලියන 8,726 කට සමාන ජපන් යෙන් මිලියන 5,166 ක් වූ මුළු වෙන්කිරීමෙන් සියයට 7.15 ක් නියෝජනය වන රු.මිලියන 446.44 කට සමාන ජපන් යෙන් මිලියන 369.46 ක් පමණක් 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති ලියවිල්ලේ වියදම් උපලේඛනයේ 42 ඡේදය ප්‍රකාරව, 2016 දෙසැම්බර් 31 දිනට ජපන් යෙන් මිලියන 2,604 ක් මුදාහැරීමට සැලසුම් කර තිබුණි. එබැවින්, ණය වලින් වියපැහැදම් නොකළ ශේෂය මත රු.මිලියන 19.92 ක බැඳීම් ගාස්තු 2016 දෙසැම්බර් 31 දිනට ණය මුදල් සපයන නියෝජිතායතනය විසින් අයකර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 26.95 ක් හා සියයට 5.77 ක් විය. ලොට් A යටතේ ජල තුළු මුව පහසුකම, ජලය පිරිසිදු කිරීමේ පිරියත, පොළවේ ජල සම්පය උස් ජල ටැංකි, යාන්ත්‍රික හා විදුලිබල කාර්යයන් හා ගොඩනැගිලි වැඩ සහ ලොට් B යටතේ ප්‍රධාන සම්ප්‍රේෂණ නළ මාර්ග හා උප බෙදාහැරීම් නළ මාර්ග වැනි ප්‍රධාන ඉදිකිරීම් කාර්යයන් 2018 පෙබරවාරි වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම ඇතුළුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2017 ජුනි 30 වන විටත් ආරම්භ කර නොතිබුණි. අදාළ නිලධාරීන්ට වගකීම් පවරමින් හා භෞතික හා මූල්‍ය ඉලක්ක මතුකර දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම හේතුවෙන් ව්‍යාපෘති කාර්යයන් මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබූ බව විගණනයේදී අනාවරණය විය.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ලියවිල්ලේ ක්‍රියාත්මක කිරීමේ උපලේඛනයේ 2.2 ඡේදය අනුව, ව්‍යාපෘති කාර්යයන් සඳහා උපදේශකවරයෙකුගේ සේවාවන් 2013 පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා ලබාගත යුතු විය. කෙසේ වුවද උපදේශක සේවා සඳහා කොන්ත්‍රාත්තු, 2014 ජුනි 13 දින පිරිනමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ සියලු කාර්යයන් මාස 15 ක ප්‍රමාදයක් සහිතව ආරම්භ කර තිබුණි.

(ආ) ලොට් C 1 යටතේ ඉසින්බස්සාගල බෙදාහැරීම් කලාපයේ බෙදාහැරීම් පද්ධතිය සහ ලොට් C 3 යටතේ නැගෙනහිර රඹෑව, ඇතන්කඩ සහ රඹෑව බෙදාහැරීම් කලාපයේ බෙදාහැරීම් පද්ධතිය ප්‍රසම්පාදනය සහ සවිකිරීම සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම හා ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම පිළිවෙලින් 2015 මැයි මාසයේදී හා 2015 දෙසැම්බර් මාසයේදී සැලසුම් කර තිබුණි. කෙසේවුවද, 2016 ඔක්තෝබර් හා නොවැම්බර් මාසයේදී පිළිවෙලින් කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම හා ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සිදු කර තිබුණි. තවද, ඉසින්බස්සාගල බෙදාහැරීම් කලාපය යටතේ කිලෝමීටර් 112.7 කින් කිලෝමීටර් 4.1 ක ජලනල එළීම් කාර්යයන් හා නැගෙනහිර රඹෑව, ඇතන්කඩ සහ රඹෑව බෙදාහැරීම් කලාපය යටතේ කිලෝමීටර් 125.15 කින් කිලෝමීටර් 2.6 ක ජලනල එළීම් වැඩ පමණක් 2016 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් නිම කිරීමේ නියමිත දිනයන් පිළිබඳ සැලකීමෙන් තොරව කොන්ත්‍රාත්තු යටතේ කාර්යයන් නිම කිරීමේ කාල පරිච්ඡේදය 2018 අප්‍රේල් දක්වා සංශෝධනය කර තිබුණි.

**3.4 මූල්‍ය පාලනයන් පිළිබඳ කරුණු**

**-------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ගණකාධිකාරී තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 19 දින අනුමත කර තිබුණද, එම තනතුර පිරවීම සඳහා 2017 අගෝස්තු 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 133 හා 2010 ජුලි 10 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.